**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :-15/2001**

මගේ අංකය :- ආ/III/4/40
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2001.08.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**වේලා සටහන් යන්ත්‍ර සවි කිරීම.**

1989.06.20 දිනැති 37/89 හා 1990.01.03 දිනැති 1/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරමි.

02. වේලා සටහන් යන්ත්‍ර භාවිතය මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සම්බන්ධ සටහන් වඩා විධිමත්ව පවත්වාගෙන යාමට හැකි වන බැවින් සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා මෙම යන්ත්‍ර සෑම කාර්යාලයකම භාවිතා කළ යුතු බවට තීරණය කර ඇත.

03. පවත්නා මූල්‍ය ප්‍රතිපාදන යටතේ වේලා සටහන් යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කළයුතුය.

04. භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය